# සිනමා නිර්මාණ වාරණය හේතුවෙන් ඇතිවන සමාජයීය බලපෑම පිළිබඳ අධ්‍යයනයක් (බොරදිය පොකුණ චිත්‍රපටය ඇසුරෙන්)

*ඩී.එස්. කුමාරසිංහ [1]*

සිනමාව යනු, කලාවක් මෙන්ම කර්මාන්තයක් වන අතර ප්‍රබල සමාජ පණිවිඩයක් ගෙනහැර දැක්විය හැකි මාධ්‍යයකි. නමුත් ඇතැම් නිර්මාණ වාරණය හේතුවෙන් සමාජයට සිදුවන බලපෑම ප්‍රබල ය. සත්‍යජිත් මායිටිපේ අධ්‍යක්ෂණය කරන ලද බොරදිය පොකුණ වූ කලී කාන්තාව හා ලිංගිකත්වය තේමා කොටගත් 90 දශකය මැද භාගයේ වාරණයට ලක් වූ සමාජමය බලපෑමක් ඇති කළ නිර්මාණයකි. සිනමා නිර්මාණ වාරණය හේතුවෙන් ඇතිවන සමාජ බලපෑම පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි අරමුණ වේ. පර්යේෂණ ක්‍රමවේදය ලෙස ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය මෙහි දී යොදා ගන්නා ලදී. දත්ත ලබා ගැනීම සඳහා සඟරා, ලිපි, අන්තර්ජාලය, සමාජ මාධ්‍ය වැනි ද්විතීයික මූලාශ්‍රය උපයෝගී කරගන්නා ලදී. බොරදිය පොකුණ වාරණය කිරීමට හේතු වූයේ ලිංගිකත්වය, අසභ්‍ය වචන භාවිත කිරීම හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැනි කරුණු ය. මෙම නිර්මාණය සඳහා පාදක වූයේ 1977 විවෘත ආර්ථිකයත් සමග බියගම කටුනායක වෙළෙඳ කලාපය ආශ්‍රිත ව සේවය කළ ග්‍රාමීය කාන්තාව ලිංගිකව රැවටිලිකාරයන්ට ගොදුරු වීම හා අනිසි බලපෑමට ලක්වීම ය. නමුත් මෙම චිත්‍රපටය සමාජය තුළ වැඩි වශයෙන් කතා බහට ලක්වන්නේ වාරණයට ලක්වූ පසුව ය. වැඩිහිටියන්ට පමණක් සුදුසු නිර්මාණයක් වන මෙය වාරණයට ලක් කිරීම හේතුවෙන් කාන්තාව හා ලිංගිකත්වය යන ප්‍රධාන ගැටලු පිළිබඳ ප්‍රේක්ෂකයා හට ආකල්පමය වශයෙන් ධනාත්මක පණිවිඩයක් සමාජගත කිරීමේ ඉඩකඩ ඇහිරී ගොස් ඇත. මෙවන් සිනමා නිර්මාණ වාරණය හේතුවෙන් සිංහල සංස්කෘතිය තුළ සාකච්ඡාවට ලක්විය යුතු ලිංගිකත්වය වැනි තේමා යටපත් වීම, ප්‍රේක්ෂකයා තුළ ආකල්පමය වෙනසක් ඇති කිරීමට නොහැකි වීම හා සම්මානයට පාත්‍ර විය යුතු රංගන ශිල්පීන්ගේ දක්ෂතා ඇගයීමට නොහැකි වීම වැනි සෘණාත්මක බලපෑම් රැසකට හේතු වේ. මෙම අධ්‍යයනය තුළින් නිගමනය කළ හැකි වන්නේ ලංකාවේ සිනමා නිර්මාණවල ගුණාත්මකභාවය පවත්වා ගැනීමට ලිහිල් වාරණයක අවශ්‍යතාව මෙන්ම ප්‍රේක්ෂකයා ආකල්පමය වසයෙන් වෙනත් දෘෂ්ටිකෝණයකින් චිත්‍රපට නැරඹීමට යොමු කිරීමට චිත්‍රපට නිෂ්පාදකයන්ට හැකි වන ලෙස නිර්මාණශීලී ව සමාජගත ගැටළු ප්‍රකාශ කිරීමට අවශ්‍ය පරිසරය සකස් කර දීමේ අවශ්‍යතාව දැඩි ලෙස පවතින බව ය.

***මුඛ්‍ය පදඃ*** සිනමාව, වාරණය, ලිංගිකත්වය, කාන්තාව, ස්ත්‍රී පුරුෂ සමාජභාවය

[1]සමාජවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, රජරට විශ්වවිද්‍යාලය. dileshakumarasingha@gmail.com